# සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
# நலன்புரி நன்மைகள் சபை
# WELFARE BENEFITS BOARD

**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**

**තනතුරු පුරප්පාඩු දැන්වීමයි**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ස්ථාපිත සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා සුදුසුකම් සහිත පළපුරුදු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. **සියලුම තනතුරු කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයේ පමණක් අනුයුක්ත කරනු ලැබේ.**

| | තනතුර | තනතුරු සංඛ්‍යාව | සුදුසුකම් |
|---|---|---|---|
| 01 | සහකාර සුබසාධක කොමසාරිස් (තොරතුරු තාක්ෂණ)<br>(MM-1-1- II ශ්‍රේණිය) | 01 | **සුදුසුකම් හා පළපුරුද්ද**<br>**<u>බාහිර අපේක්ෂකයින් (පහත 1 හෝ 2)</u>**<br>1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පිළිගනු ලබන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, පරිගණක විද්‍යාව, මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව යන විෂය පථයන්ට අදාළ හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් උපාධියක් ලබා තිබීම.<br>**සහ**<br>පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) වසරක පළපුරුද්ද සුදුසුකම් ලැබීම.<br>2. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් මඟින් නිකුත් කරන ලද, ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 7 වන මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම.<br>**සහ**<br>රාජ්‍ය සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්ද සුදුසුකම් ලැබීම.<br>**<u>අභ්‍යන්තර අපේක්ෂකයින් (පහත 1 හෝ 2)</u>**<br>1. ඉහත බාහිර අපේක්ෂකයින් විසින් අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.<br>2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ, කනිෂ්ඨ කළමනාකාර (JM) මට්ටමේ තනතුරක වසර පහක (05) අවම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br>**වැටුප් පරිමාණය** :- . 91,690 - 10 x 2,480 - 15 x 3,450 - 168,240 (MM 1-1)<br>**මූලික වැටුප් පියවර** :- Rs. 81,710/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 හි 2026.01.01 උපලේඛන II අනුව)<br>රජයේ අනුමත දීමනා + භාණ්ඩාගාර චක්‍රලේඛ අනුව සන්නිවේදන දීමනා සඳහා හිමිකම් ලබයි. |

**වයස :**

**සහකාර සුබසාධක කොමසාරිස් (තොරතුරු තාක්ෂණ)**

- වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**පොදු කොන්දේසි :**

- සම්මුඛ පරීක්ෂණයේදී කුසලතා අනුපිළිවෙලට පමණක් පත්වීම් සිදු කරනු ලැබේ.
- මෙම තනතුරු ස්ථිර වේ. ස්ථිර කිරීමට පෙර වසර **03** ක පරිවාස කාලයකට යටත් වේ.

**මාසික වැටුප :**

- MM 1-1-2025 Rs. (91,690 – 10 x 2,480 - 15 x 3,450 – 168,240) + රජයේ අනුමත වෙනත් දීමනා,
- වැටුපෙන් 8% ක් සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතු අතර සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් 12%ක් රජයේ දායක මුදල් ලෙස ගෙවනු ඇත. තවද, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට 3% ක දායක මුදලක් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් ගෙවනු ලැබේ.

- <u>ආදර්ශ අයදුම්පත්‍රය පහත වෙබ් අඩවි වලට පිවිසීමෙන් බාගත කර ගත හැකිය.</u>
  - https://www.treasury.gov.lk/web/ministry-of-finance-vacancies/section/current%20vacancies
  - https://www.wbb.gov.lk/web/si/jobs

- නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත්, අදාළ සහතිකවල පිටපත් සමඟ ඉල්ලුම් කරනු ලබන තනතුර ලියුම් කවරයේ ඉහළ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කර **කොමසාරිස්, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය, ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය, අංක 191, ධර්මපාල මාවත, කොළඹ 07** යන ලිපිනයට **2026.05.11** දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

- **රජයේ දෙපාර්තමේන්තු හෝ ව්‍යවස්ථාපිත ආයතනවල අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් හරහා ඉදිරිපත් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන, අසම්පූර්ණ (අදාළ සහතිකවල පිටපත් නොමැතිව) හෝ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

- දැන්වීම අවලංගු කිරීම, වෙනස් කිරීම හෝ අපේක්ෂකයින් කෙටි ලැයිස්තුගත කිරීම සම්බන්ධයෙන් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ කොමසාරිස්වරයා මෙම දැන්වීමේ සියලුම හිමිකම් රඳවා ගනු ඇත.

**කොමසාරිස්**
**සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය**
**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**

04/20.

Source: www.treasury.gov.lk (2026.04.27)